# ලංකේෂ්වර
# ඇශ්ණ



යසිරු මන්දාර

# ලංකේශ්වර අස්න

කේ. පී. යසිරු මන්දාර

ISBN : 978-624-208-044-4

2023 දෙසැම්බර් 07 වන දින

## <u>පිදුම</u>

මා හට අපමණ ආදරය කොට

ගුණදහම් මැනවින් කියා දුන්

මාගේ ආදර

අම්මාට

හා

තාත්තාට

හද පිරි බැතියෙන්

පුදමි.

## කර්තෘගෙන් ...



මෙම පොත ලිවීමට මා හට පසුබිම සැකසුනේ කුඩා කල සිටම මා තුල තිබු ඉතිහාසය පිළිබඳ දැනගැනීමට තිබු කුතුහලයයි. පසුව ඒ සම්බන්ධයෙන් පොත් පත් කියවා ඇතැම් විට නටඹුන් ඇති ස්ථාන වලට ගොස් ඒවා බලා ඒ පිළිබඳව දැන ගැනීමක් ලබා ගතිමි. ඉන් මා තුල නිසඟයෙන් පොතක් ලිවීමට පාදක වු බොහෝ කරුණු එකතු කිරීමට හැකියාව ලැබී තිබුණි.

ඒ අතර මහනුවර මහාමායා විද්‍යාලයේ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය ගැන දැනගන්නට ලැබිණි. මා තුල රැස්කරගත් දැනුම පොතකින් එලි දැක්වීම සුදුසු යයි සිතුනි. ඊට මූල බීජය සැපයු මහනුවර මහාමායා විද්‍යාලයේ ආචාර්ය සෙනෙවිරත්න මහලේකම් මහතාට හා විදුහල්පතිණී ශෂිකලා සේනාධීර මහත්මියට මාගේ හදපිරි ගෞරවාදරය පුදමි.

තවද අපට අතීත කරුණු දැනගැනීමට පොතපත ලියාතැබූ සියළු කර්තෘවරුන්ට මාගේ ගෞරවය පුද කිරීමට අමතක නොකරමි. මාව දිරි ගන්වමින් මා උනන්දු කල මාගේ දෙමාපියන්ට මෙන්ම සංජීව පෙරේරා බාප්පාව මතක් කිරීමට අමතක නොකරමි.

මාගේ ප්‍රාර්ථනාව අනාගතයේ බිහිවන නංගිලා මල්ලිලාට මෙම පොතෙන් යම් දැනුමක් ලබා ගනියි යන්නයි.

කේ. ජී. යසිරු මන්දාර
1/3 ඒ, ගුණතිලක පාර,
කොළොන්නාව.
071 2408712

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදී ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

# පටුන


1. රාවණ රජතුමා 01

2. රාවණයන්ට තිබූ විවිධ නාමයන් 03

3. රාවණ රජතුමාගේ පරපුර 04

4. සූර්ය නමස්කාරය 05

5. රාවණා ධජය 08

6. සීගිරිය 10

7. උමං මාර්ග 17

8. ග්‍රහ තාරකා පිළිබඳ ඥාණය 21

9. ගුවන් යානා තාක්ෂණය 23

10. සූනියම් ශාන්ති කර්මය 25

11. දහඅට සන්නිය 26

12. ගෘහ නිර්මාණ ශිල්පය 27

13. කාල තරණය 29

14. අංගම් සටන් කලාව 30

15. රාවණා හත්ථ 31

16. මූලාශ්‍ර 32

# රාවණ රජතුමා

අවුරුදු 5000 කට පෙර ඈත අතීතයේදී ලංකාව හෙළදීපය නමින් හඳුන්වනු ලැබීය. එහි විසූවන් හෙළයන් ලෙස හැඳින්විණි. එකළ හෙළයෝ යක්ෂ, නාග, දේව හා රාක්ෂ ලෙස ගෝත්‍ර 4 කට වෙන්වී ජීවත්විය. මොවුන්ගේ රජු වූයේ අධ්‍යාත්මික ශක්තියෙන් ඉතා පොහොසත් වු විශ්‍රවස් මුණිය. මෙතුමාගේ පියාවුයේ පුලස්ති ඍෂිතුමාය. පුලස්ති ඍෂිතුමාගේ පියාවුයේ මහා බ්‍රහ්මයාය. මහා බ්‍රහ්මයාට පුතුන් සත් දෙනෙකි. ඉන් එක් අයෙකු වුයේ පුලස්ති ඍෂිතුමාය. එබැවින් හෙළ පරම්පරාව මහා බ්‍රහ්මයා දක්වාම විහිදී යයි. විශ්‍රවස් මුණි ඉන්දීය කුමාරිකාවක් සරණ පාවා ගන්නා ලදී. මෙතුමිය දේව වංශික දේවවරුණීය. මෙම විවාහයෙන් මොවුනට පුතෙකු ලැබුන අතර එම පුතා වුයේ වෛශ්‍රවණය. මොහුව විශ්වපුත, කුවේර ලෙසද හඳුන්වයි. කාලයාගේ ඇවෑමෙන් දේවවරුණී මියගියේය. පසුව වෛශ්‍රවණට ලංකාදීපයේ පාලන බලය විශ්‍රවස්මුණි ලබාදී හෙතෙම නැගෙනහිර පලාතේ තපස් රැකීම සඳහා පිටත්වේ.

මේ කාලයේදී හෙළයේ තවත් ප්‍රදේශයක සුමාලින් නම් යක්ෂ ගෝත්‍රික රජ කෙනෙකු සිටියේය. මොහු ඉන්දියාවේ රජවරු සමඟ කල සටනකින් පැරදී ලංකාවේ ප්‍රදේශයක භූගතව වාසය කලේය. මොහු පසුපස ආ ඉන්දීය රජවරු මොහු පැරදවීමට සොයා ගත නොහැකිව කුවේරට ලංකාවේ රජකම පවරන ලදී. සුමලින් රජතුමා විශ්‍රවස් මුණිතුමාට පෙර මෙරට පාලනය කල අයෙකි. ඉතා ඉහල ආධ්‍යාත්මික ශක්තියක් තිබුණෙකි. ඒ අනුව දිනක් එතුමා තම අනාගතය පිරික්සන විට තම දියණියකගේ දරුවකු හෙළයේ හා සක්වලද ජයගන්නා රජකු බව දැකීය. ඒ සඳහා සුදුසු පියා කවුදැයි නිරීක්ෂණය කරන විට විශ්‍රවස්මුණි දැකගන්නට ලැබුනි. එබැවින් විශ්‍රවස්මුණි සමඟ කතිකා කරගන්නා සුමාලින් රජු තම දියණියන් දෙදෙනෙකු නැගෙනහිර පළාතේ ජීවත්වන විශ්‍රවස් මුණිතුමා වෙත පිටත්කර යවන ලදී. එසේ ගිය දියණියන්

දෙදෙනාගෙන් පුෂ්පෝත්කතා නම් කුමාරිකාව කුසෙහි දරුවෙක් පිළිසිඳ ගත්තේය.

පුෂ්පෝත්කතා කුමාරියගෙන් බිහිවූ පළමු දරුවා මහා රණබාහු කුමරුය. පසු කලෙක මෙතුමාව මහා රාවණ ලෙස හඳුන්වනු ලැබීය. විශ්‍රවස් මුණිතුමාට තවත් බිසෝවරු කිහිප දෙනෙකුම සිටියේය. එම බිසෝවරුන්ට සුපර්ණිකා, විභීෂණ, කුම්භකරණ, කර්ණ, මහෝදරී, මරව, ප්‍රපාට්ති, කුම්භිනසී, කලී, තිරිසර, දූෂතන්, විද්සුන් හා සිවුක ලෙස දරුවෝ රැසක් සිටියෝය. ඔවුන්ගෙන් ප්‍රමුකව කියවෙන්නේ සුපර්ණිකා කුමරියගේ මෑණියන් වූ යක්ෂ ගෝත්‍රික රකා දේවිය ගැනය. තවත් බිසෝවරු වූ අතර ඉන් විභීෂණ කුමරුන්ගේ මෑණියන් වුයේ නාග ගෝත්‍රික මාලනී දේවියයි. කුම්භකරණ කුමරුගේ මෑණියන් වුයේද පුෂ්පෝත්කතා දේවියයි.

# රාවණයන්ට තිබූ විවිධ නාමයන්

රණබාහු කුමරු පසු කලෙක රාවණ නමින් ලොව පතල විය. රාවණ යන නමට අමතරව මෙතුමාව විවිධ නම් වලින් ආමන්ත්‍රණය කරයි. දසෙස්, දස ශීර්ෂපති, හීදර, අසිදර, විදූදර, තිලෝනා, දසිස්, රාවන්න යන නම් වලින්ද මෙතුමාව ආමන්ත්‍රණය කර ඇත. මෙතුමාගේ නියම නම රාවන්න බවත්, පසු කලෙක රාවණ වු බවත් ජන මතයක් පවතී. කෙසේ වුවත් එකල හිරු යන්න හෙළ බසින් රෝ, රා හර, හිර ලෙස හඳුන්වා ඇත. වන්න යන්නෙන් අදහස් වන්නේ පරපුරයි. මේ අනුව හිරුගේ පරපුර හැඳින්වීමට ඇතැම්විට රාවන්න යෙදූවා විය හැක. ඇතමුන්ගේ මතයට අනුව සූර්ය වංශයේ පාලනය භාරගත් තැනැත්තා එම වංශයේ නායකයාය. ඔහු හැඳින්වීමට රාවණ යන නාමය යොදා ඇති බැවු සිතෙයි. දසෙස් ලෙසද මෙතුමා හඳුන්වනු ලබයි. ඊටද හේතුවක් තිබේ. එනම් එතුමා ලංකාව ඇතුළු රටවල් දහයක නායකයා හෙවත් රජුවීමයි. තවත් ජන ප්‍රවාදයකට අනුව ශාස්ත්‍ර දහයක් මනාකොට ප්‍රගුණ කර ඇති බැවින් දසෙස් කියා අමතන බවයි. ඊට අමතරව එතුමා සූර්යා සතු ශක්තියෙන් මනාකොට ප්‍රයෝජන ගෙන ඇත. සූර්යා සතු ශක්තිය කොටස් දහයකට බෙදා ප්‍රයෝජනයට ගත් බැවින් දසෙස් ලෙස ආමන්ත්‍රණය කල බවටද තවත් මතයක් සමහරුන් තුල පවතී. තවද රාවණා රජතුමා පෘතුවියට අමතරව විවිධ ග්‍රහලෝක සමගද සබදතා පවත්වා ඇති අතරම ඇතැම් ග්‍රහලෝක සමග යුද්ධ පවා සිදූකොට ඇත. මෙසේ සෞරග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහයන් නවයත් ඉන් පිටත ඇති තවත් ග්‍රහලොවක් පාලනය කර ඇත. ඒ අනුව එතුමා ග්‍රහලෝක දහයක් පාලනය කොට ඇති බැවින් දස ශිර්ෂපති යන නාමයෙන්ද ආමන්ත්‍රණය කල බව තවත් අදහසකි.

# රාවණ රජතුමාගේ පරපුර

**මහා බ්‍රහ්මයා**

**පුලස්ති** — දේවවාංශික දේවවරුණ ( බිසව)

**විශ්‍රාවස්** — පුෂ්පෝත්කතා ( බිසව )
රකා ( බිසව )
මාලනී ( බිසව )

**රාවණ** — මන්දෝදරී ( බිසව )

**මේඝනාද , ශොහිලි**

# සූර්ය නමස්කාරය



රාවණ රජතුමා සූර්ය වංශිකයෙකි. සූර්ය වංශිකයා යනු සූර්යා දෙවියෙකු කොට සලකා එම දෙවියාට වන්දනා කරන ප්‍රජාවයි. හෙළයා සූර්යයා ලෝකයේ ආරම්භයට, ජීවයේ පැවැත්මට හා විනාශයට හේතුවන බව හොඳකාරවම දනී. තමන්ගේ දෛනික ජීවිතයට මෙන්ම ලෝකයේ පැවැත්මටත් සූර්යයාගෙන් ලැබෙන උදව් කොතෙක්දැයි කියා ඔවුන් අවබෝධ කරගෙන සිටියෝය. ඒ අනුව සූර්යයාගෙන් ලැබෙන උදව්වලට කෘතගුණ සැලකීමක් ලෙස රාවණ රජතුමා ඇතුළු හෙළයෝ සූර්ය නමස්කාරය මහත් බැතියෙන් හා ගෞරවයෙන් යුක්තව ඉටු කිරීමට වෙහෙස වූහ.

හිරු හා සඳුගෙන් තමාගේ ප්‍රජාව බිහිවූ බවට එදා සිටි හෙළයෝ තදින්ම විශ්වාස කලහ. ඒ හා බැඳුණු ජනකතාද අපමණය. මේ ජීවයේ ආරම්භක කතාද සූර්ය නමස්කාරයට බලවත් හේතුවක්වූවා විය හැක. සූර්ය නමස්කාරයට ඉතා ඉහල ස්ථානයක් තෝරා ගනී. මේ සඳහා බොහෝවිට උස් කඳු පන්ති තෝරාගෙන ඇත. ඒ අතර සීගිරිය, රිටිගල, සමනල, නකල්ස් ආදී කඳු ගෙනහැර දැක්විය හැක. සීගිරි ගලෙහි ඉහලම කොටසේ රාවණ රජතුමා සූර්ය නමස්කාරය කර ඇති අතර සමනල කන්දේද හිරු නැම්දීමට විශාල රුචිකත්වයක් දක්වා ඇත. ඊට හේතු ලෙස පෙනෙන්නේ මුළු අවුරුද්ද පුරාම සමනල කන්දට හා ඒ අවට ඉතා හොඳින් සුළං

හැමීමත්, මේ කන්දේ සිට ඉතාමත් හොඳින් හිරු උදාව මෙන්ම හිරු බැසීම දැක බලා ගත හැකි නිසාය. මේ අනුව හිරු උදාව හොඳින් පෙනෙන නිසා සූර්ය නමස්කාරයට ඉතා පහසුවක් වී ඇත.

සූර්ය නමස්කාරය කරන්නේ කෙසේදැයි අපි මදක් විමසා බලමු. නැගෙනහිර අහසින් මුලින්ම නැගී එන සූර්යයා දෙස බලා තමාගේ අත් දෙක හිසට උඩින් ගෙන සූර්යයාට නමස්කාරය කරයි. එසැනින් තමන්ගේ දකුණු කකුල නවා අනෙක් වම් කකුලේ දණහිස මත තබා ගනී. ඉන්පසු සූර්යයාට සාදා ඇති විශේෂ මන්ත්‍ර හා සුත්‍රෝත්‍ර ගායනා කරමින් සූර්යයා නමස්කාරය කරයි. රාවණ රජතුමාට මේ සඳහා බලගතු මන්ත්‍ර හා හිරු යතුරක් (යන්ත්‍රයක්) තිබී ඇත. මෙම යතුර රන්පතක ලියා එතුමාගේ ඔටුන්නේ තැන්පත් කරගන්නට කටයුතු කොට ඇත. මේ හේතුවෙන් විශාල ශක්තියක් ඉන් ජනිත වී ඇත්තාසේම එතුමා ඉන් නොයෙකුත් බලපරාක්‍රමද කරවා ගෙන ඇත.

හෙළයේ විසූ යක්ෂ, නාග, රාක්ෂ හා දේව යන සිව් හෙළයෝම මහත් භක්තියෙන් සූර්ය නමස්කාරය කෙරුවාට සැක නැත. මෙම නමස්කාරය හේතුකොට ගෙන විශ්වයේ ඇති මහා බලගතු ශක්තියක් ඔවුනට ලගාවෙයි. අපි වැඩිහිටියන් නැමදි විට ලැබෙන ආශිර්වාද සේම සූර්යයා නැමදි විටද එවැනිම ආශීර්වාද ලැබෙතැයි ඔවුන් විශ්වාස කලහ.

අතීතයේදී සූර්ය දෙවියන්ගේ සංකේතයක් ලෙස භාරතියෝ ශිව දෙවියන් හඳුන්වයි. නමුත් හෙළයෝද සිව ලෙස සූර්යයා හඳුන්වයි. හෙළයන්ට සූර්යයා නමස්කාර කිරීමට මුන්නේෂ්වරම් හි හිරු දෙවොලක් නිර්මාණය කොට දී ඇත. තවත් හිරු දෙවොලක් අරන්කැලේද ඇත. රාවණා රජතුමා ග්‍රීසිය, මිසරය, පර්සියාව, පේරු වැනි රටවල්ද ආක්‍රමණය කොට ඇති අතර එරට ජනයා

මෙතුමා රා දෙවිඳු ලෙස හඳුන්වයි. මෙම වැසියෝද සූර්ය නමස්කාරය සිදුකොට ඇත. ඇතැම් විට එය හෙළයාගෙන් ලැබුණු වන්දනාවක් විය හැක.

සූර්ය නමස්කාරයෙන් ශරීරය නීරෝගීව තබා ගත හැක. ශිව කණ්ඩව ස්ත්‍රෝත්‍ර ග්‍රන්ථය හා සූර්ය තන්ත්‍රය නම් ග්‍රන්ථ රාවණා රජතුමා සූර්ය දෙවියන් වෙනුවෙන් රචනා කොට ඇති බැව් පෙනෙයි. රාවණා රජතුමාගෙන් පසු විජය රජු දක්වා ලංකාවේ පහල වු සියළු රජවරු සූර්ය නමස්කාරය ඉතා බැතියෙන් යුතුව සිදුකල බැව් පෙනේ.

# රාවණා ධජය

එකල යක්ෂ ගෝත්‍රිකයන් හෙළයන් පාලනය කලේය. එහි සිව් හෙළයක් පැවති අතර යක්ෂ, රාක්ෂ, නාග හා දේව එම සිව් හෙළයයි. මෙහි හෙළයෝ තමන් නිර්මාණය වුයේ ඉරෙන් හා හඳෙන් බව පිළිගනියි. එබැවින් ඔවුනගේ ධජයට මුලින්ම ඉර හා හඳ යොදා ගන්නා ලදී. පසු කලෙක රාවණ රජතුමා සීගිරියේ සිටි කුවේර පරාජය කොට සීගිරිය තමා සතු කරගත්තේය. මේ කුවේර තම ධජය ලෙස සිංහයෙකු සිටි ධජය භාවිතා කොට ඇත. නැවත රාවණා රජු මුළු ලක එක්සත් කොට අළුතින් නිර්මාණය කල ධජයේ ඉර හඳට අමතරව කුවේර තම ධජයට යොදාගත් සිංහයාගේ රුවද යොදා ගෙන ඇත. පසුපස කකුල් දෙකෙන් සිටගෙන සිටින සිංහයෙකුගේ රුවක් එහි යොදා ඇත. මෙහි සිංහයාගේ එක අතක කඩුවකුත් අනෙක් අතේ පළිහකුත් දරා සිටින රුවකින් නිරූපිතය. රාවණ රජතුමාගේ කාලයේදී හෙතෙම රටවල් නවයක් තමන් සතු කර ගත්තේය. එම රටවල් නවයේ ඔටුනු හා කොඩි තමා සතුව තබා ගත්තේය. සීගිරි මාළිගය මුදුනේ ඉහලින්ම ඉර හා සඳ ඇතුලත් රාවණ ධජය ලෙලදිණි. ඊට පහලින් තමා සතුකරගත් රටවල් නවයේ ධජ එල්ලා තිබුණි. ඇතම් ජන ප්‍රවාදවලට අනුව හෙළයෝ දැඩි ලෙස සූර්‍යයාට ගෞරව කළ බව නොරහසකි. එබැවින් සූර්‍යයාගේ රශ්මි දහරාව සිංහයාගේ කේසර වලට සමාන බැවින්ද කේසර වලින් යුක්ත සිංහයෙකු නිර්මාණය කර එය රාවණ රජුගේ ධජයේ තිබු ඉර හා හඳට අමතරව සිංහ රූපයද එක් කළ බවයි.

රාවණ අධිරාජ්‍යයාගෙන් පසු ලංකාව පාලනය කලේ විභීෂණ රජුය. තමාගේ සොහොයුරාට ගෞරවයක් වශයෙන් එතුමාගේ රුව හෙළයේ ධජයේ නිර්මාණය කලේය. මෙම ධජය හෙළයේ ජාතික

ධජය ලෙස ඉන්පසු ජනගත විය. විජය රජු ලංකාවට පැමිණෙන තෙක් මේ ධජය හෙළයේ ධජයම විය. විජය රජු පැමිණීමෙන් එතුමා ගෙනා කොඩිය භාවිතා කලේය. එහිද සිංහයකුගේ රුවක් ඇත. විජය රජුගේ පරපුර සිංහ පරපුරකින් පැවත එන බැවින් ඔහු තම ධජයට සිංහ රුව එක්කර ගන්නට ඇත.

විජය රජු තම ධජය වශයෙන් සිංහ කොඩිය භාවිතා කළද රාවණා රජතුමාට කරන ගෞරවයක් ලෙස රාවණ රුව සහිත කොඩිය ප්‍රදේශිය කොඩියක් ලෙස මෑතක් වනතුරුම භාවිතා කරන ලදී. ත්‍රී සිංහලය ලංකාව බෙදුවිට කොත්මලේ දිසා කොඩිය ලෙස මෙම ධජය භාවිතා විය. කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස හේවාහැට කොඩිය වී පසුව දේවාල හා කෝවිල්වලට මෙම ධජය භාවිතා කිරීමට යොදා ගෙන ඇත.

කොත්මලේ දිසා කොඩිය ගුරු පැහැති පසුබිමකින් යුත් තීරුවක් වැනි උස්වූ කොඩියකි. රාවණ රජුගේ රුව තද කහ පැහැයෙන් සිත්තම් කර ඇත. හිසෙහි ඔටුන්නක්ද, එක් අතකින් දුන්නක් හා අනෙක් අතින් ඊතලයක්ද ගෙන රාවණ උත්තුංග දේහ විලාසයෙන් නිරූපිතය. එම රුව දෙපස ඉර හඳ සලකුණු ඇත. කොඩියේ බෝඩරය පලා පෙති වලින් නිර්මිතය.

තවද රාවණ කොඩිය සම්බන්ද ජන කවියක් පහත වේ.


සක් දෙවිඳුයි හා රුව සඳ මත ඇන්දේ

සමන් නිරිඳු වැජඹේ සමනල කන්දේ

ගැමුණු නිරිඳු සතුරන්ගේ බල බින්දේ

රාවණ කොඩිය බැබලේ තලගල කන්දේ

# සීගිරිය



සීගිරි පර්වතය සිවගිරිය, සිහගිරිය යන විවිධ නම්වලින් හඳුන්වනු ලබයි. බොහෝවිට මෙම පර්වතයට මෙම නම යෙදී ඇත්තේ සූර්ය නමස්කාරයට භාවිතා කල ගිරිය යන අර්ථය ගැනීමට විය හැක. සිව ලෙස සූර්යා හැඳින්වෙන අතර කන්ද ගිරිය ලෙස හඳුන්වයි. සිව ගිරිය වු පර්වතය පසුව සීගිරිය වූවා විය හැක. කෙසේ නමුත් මෙම පර්වතය අඩි 1132 ක් පමණ උසකින් යුක්තය.

අතීත තොරතුරු වලට අනුව ඉතා ඈත අතීතයේ මෙම පර්වතය ගිනි කන්දක්ව පැවතී ඇත. ඒ අනුව ගිනි කන්දක් පිපිරීයාමේදී අභ්‍යන්තරයේ ඇති ලාවා පිටතට ගලා යාම අනිවාර්යෙන් සිදුවෙයි. මෙලෙස පිටතට ලාවා ගලායාම හේතුකොට කන්ද අභන්තරයේ විශාල ප්‍රමාණයේ හිස් අවකාශයක් නිර්මාණය වී ඇත. මෙම හිස් අවකාශය නොහොත් භූමි ප්‍රමාණයතුල විශාල ඉදිකිරීම් සිවගිරිය තුල සිදුකොට ඇති බව පෙනෙයි. එනම් ඒ තුල ඇති කාමර හා විශාල පළලින් යුත් රැස්වීම් ශාලාවල එකවිට 100 දෙනෙකුට වැඩි පිරිසකට සහභාගීවීමට හැකි අයුරින් නිර්මිත කොට ඇති අතර කාමර විශාල සංඛ්‍යාවකින්ද යුක්ත බව ජනප්‍රවාදය කියයි. මෙම මාලිගය අභ්‍යන්තරයේ රාත්‍රී කාලයේ අඳුර මකා දැමීමට පහන් හා විලක්කු දහස් ගණනක් දල්වා ඇත. මෙසේ

පහන් දහස් ගණනක් දල්වා ඇත්තේ මාලිගය අභ්‍යන්තරය විශාල නිසාත්, එහි අභ්‍යන්තරයේ විවේකාගාර, රැස්වීම් ශාලා හා භෝජනාගාරද තිබෙන්නට ඇති බැවිනි. එබැවින් විශාල පහන් හා විලක්කු ප්‍රමාණයක් භාවිතා කොට ඇත. මින් විශාල ආලෝකයක් නිතුත්වී ඇත. එම ආලෝකයෙන් මාලිගය අභ්‍යන්තරය මනාව ආලෝකවී ඇතිවා සේම පහන් වලට ආලෝකය ගව් ගණනක් දුරට පෙනී ඇත. මේ අනුව රාත්‍රියට සිගිරිය මිහිබට සුරපුරයක් ලෙස දිස්වූ බව රාමායණයේ පවා සඳහන් වෙයි.

මුලින්ම සීගිරිය භාවිතයට ගෙන ඇත්තේ රාවණා රජතුමාගේ වැඩිමහල් සොහොයුරා වූ කුවේරය. මෙතුමා ධන කුවේරයෙකි. එමනිසා මෙතුමා ඉතා අලංකාර අයුරින් සිගිරිය තම වාසස්ථානය ලෙස ගොඩනගා පරිහරණයට ගෙන ඇත. පසු කලෙක රාවණා රජ සමඟ සටන්කොට එම සටනින් පැරදී ඉන්දියාවට උමං මාර්ගයක් ඔස්සේ පලා යන ලදී. එසේ පලාගියාට පසුව රාවණ රජතුමා සීගිරිය තමා සතුකොට ගත්තේය.

සීගිරිය විශේෂිත තැනකි. එනම් එය බලකොටුවකට සමානය. එබැවින් සීගිරියේ ආරක්ෂාවට පවුරු සතක් නිර්මාණය කොට ඇත. එම පවුරු සතෙහිම එක් දිශාවකට එක් දොරටුවක් බැගින් සතර දිශාවටම දොරටු සතරකි. පවුරු හතක් තිබී ඇති බැවින් දොරටු විසි අටක් තිබී ඇත. ඉන් සීගිරි මාළිගාවට උපරිම ආරක්ෂාව ලබා දීමට උත්සාහ ගෙන ඇතත් ඉන් නොනැවතී දිය අගල් දෙකක් නිර්මාණය කොට ඇත. ඉන් මාළිගයේ ආරක්ෂාව තවත් තරවී ඇත.

තවද සීගිරිය උඩ සිට අවට බැලූ කෙනෙකුට හතර වටේටම ඇති සීමාව මනාව පෙනෙයි. මෙහිදී සතුරු ආක්‍රමණයක් සිදුවුවද සීගිරියේ සිටින්නෙකුට එම ආක්‍රමණය බලා ඉක්මනින්ම සතුරු

ග්‍රහනයෙන් මිදිය හැකි බැවින් මෙය ආරක්ෂිත බලකොටුවක් ලෙසද භාවිතයට ගෙන ඇත.

තවද තැනිතලාවක් ලෙස ගලෙහි මුදුනේ පැවැත්මත් සීගිරියේ විශේෂ ලක්ෂණයකි. රාවණා රජතුමා සීගිරිය මුදුනෙහි තමාම තාරකා හා ග්‍රහයන් පිළිබඳ පරීක්ෂණ කිරීමට පරීක්ෂණාගාරයක් පිහිටුවා ගත්බව ජනප්‍රවාදයේ කියයි. විශේෂිතම දෙය වන්නේ එතුමාට උදෑසන සූර්ය නමස්කාරය සඳහා උචිත පරිසරයක් සීගිරිය පර්වත මස්තකයේ නිරායාසයෙන්ම පිහිටා තිබීමයි. එතුමා මන්ත්‍ර ස්තෝත්‍ර හා ඉර, හඳ, තරු, ග්‍රහලෝක පිළිබඳ විද්වත් සමුළුද මෙම සීගිරිගල මස්තකයේ පවත්වා ඇති අතර ඊට පුලස්ති ඍෂිතුමාද සහභාගීවී ඇති බව කියයි. රාවණ රජතුමා සීගිරිය මස්තකයේ හෙළ ධජය පිහිටුවීමට කටයුතු කොට ඇත.

තවද සීගිරිය ඇතුලත මහල් තුනකින් සමන්විත වී ඇති අතර මහල් තුන අතර හා කඳු මුදුනට යාමට විශේෂයෙන් සෑදූ යන්ත්‍රයක් භාවිතා කොට ඇත. එම යන්ත්‍රය උභනය ලෙසත් තවත් අය කර්කටක යන්ත්‍රය ලෙසත් හඳුන්වයි. මෙම යන්ත්‍රය වර්තමානයේ අපව තට්ටු අතර ඉහල පහළ ගෙන යන සෝපානයකට සමානය. මෙම උභනය නැතහොත් කර්කටක යන්ත්‍රය මිනිස් ශ්‍රමයෙන් හා සුළං බලය උපයෝගී කොට නිර්මාණය කර ඇති අතර ඊට රත්තරං ආලේපිත කොට ඇති බැව් කියවෙයි. මීට අමතරව තට්ටු අතර පියගැට පෙළ තිබී ඇත. සීගිරිය පහල සිට ඉහලට යාමටද පියගැට පෙළවල් තිබී ඇත. කන්ද උස බැවින් පියගැට පෙළ අතර තැන්වල ගිමන්හැරීමට ගිමන්ස්ථානද තනා ඇත. මෙම ස්ථානවල ගලින් තැනූ ආසන දක්නට ඇත. එසේ ඉහල නගින අයට ඉතා කුඩා පෙකුණුද අවශ්‍ය වුවහොත් ජල අවශ්‍යතා සපුරා ගැනීමට තනවා තිබෙන්නට ඇත.

මෙහි ගොඩනැගිලි බොහෝමයක් තනා ඇත්තේ කැටගල් හා ගඩොල් වලිනි. අවශ්‍ය තැන්වලදී හුණු, ගල්, වැලි, කලුගල්කුඩු ආදියද භාවිතයට ගත් බව පෙනෙයි. තවත් තැන්වල දැවයෙන්ද මහල් නිර්මාණය කර ඇත.

සීගිරියේ කඳු මුදුනට නගිනවිට විශාල සිංහ මුවක් අතීතයේ තනා ඇත. එයින් ඇතුල්වූ විට කඳු මුදුනට නැගීමට අවශ්‍ය පියගැට පෙළ දක්නට ඇත. මෙම සිංහමුව තනා ඇත්තේ සිහපල් නම් සොරාය. නමුත් දැනට දක්නට ලැබෙන පාද දෙක ඇතමුන් සිංහයකුගේ පාද ලෙස දක්වයි. තවත් කෙනෙකු ගුරුළා යන පක්ෂියාගේ පාද දෙක බව කියයි. ඊට හේතුව ලෙස දක්වන්නේ එම පාදයේ ඇඟිලි තුනක් පමණක් දක්නට ලැබීමය.

ගල අභ්‍යන්තර මාළිගය ඇතුලත බිත්ති වීදුරු මෙන් ඔපකර සකසා ඇත. ඊට විශේෂ බදාම වර්ගයක් භාවිතා කොට ගෙන ඇත. රාවණ රජතුමා වීදුරු සෑදීමට ගත් ද්‍රව්‍ය වලින් මේ විශේෂ බදාමය සාදා ඇත. එබැවින් රාවණ රජතුමා හෝ වෙන කෙනෙකු එම කාමරයට ගිය විට වටේටම තමාගේ ඡායාව පෙනෙයි.

සීගිරිගල භෞතිකව පිහිටා ඇත්තේ උණුසුම් ප්‍රදේශයකය. හිරු රැසට සීගිරියද රත්වෙයි. එහි උෂ්ණත්වය සීගිරිය තුල ඇති මාළිගයට නියත වශයෙන්ම දැනෙයි. එබැවින් මාළිගය තුල උණුසුම නැති කිරීමට දිය පොකුණු, දිය ඇල් බොහෝ ප්‍රමාණයක් සාදා තිබුණි. ඉන් මාළිගයේ උෂ්ණත්වය බොහෝදුරට පහල දැමීමට හේතු විය. වර්තමානයේ අපගේ ගෙවල් වල සවිකරන වායුසමීකරණයකින් ලැබෙන සිසිලස එකල සීගිරිය තුලට මේක්‍රමයෙන් ලබා ගැනීමට හෙළයෝ සමත්ව ඇත. සීගිරි මාළිගයේ ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ජලය නල මඟින් ඉහලට ගෙන ගොස් ඇත. මේ සඳහා සීගිරිය අසල සීගිරිය නමින් වැවක් තිබී ඇත. එම වැවෙන් යතුරු බලයෙන් සීගිරිය මුදුනට වතුර

ගෙනගොස් ඇත. එසේ වතුර ඉහලට ගෙනගියේ කෙසේදැයි විමසුවහොත් පෙනීයන්නේ වායුවෙන් වැඩකල යතුරු බලයක් මේසඳහා යොදාගෙන ඇති බවයි. මේ සඳහා යතුරු කිහිපයක් භාවිතා කරන්නට ඇති බව පෙනීයයි. ඉන් එක් යතුරකින් සීගිරි වැවේ සිට සීගිරි පව්ව මැද තිබූ පොකුණට වතුර ඔසවා ඇත. එම පොකුණ වතුරෙන් පිරුණු පසු ප්‍රයෝජනයට ගෙන ඇත. තවත් යතුරකින් සීගිරි පව්ව මැද තිබූ පොකුණෙන් සිගිරි පව්ව මුදුනට වතුර ගෙන යන්නට ඇත.

මෙසේ ගෙනගිය වතුරෙන් අවශ්‍යතා සපුරා ගන්නා ලදී. ඉන් ප්‍රයෝජනයට ගෙන ඉතිරිවූ ජලය නැවත පහලට වතුර මල් වැටීමට සලස්වා ඇත. ඉන් මාලිගයට ආරක්ෂාවක් හා සිසිලසක් ලබාදීමට මහෝපකාරී වෙයි. තවද කන්ද මුදුනේ පොකුණු තනවා ඇත. එම පොකුණු මගින් වැස්සෙන් ලැබෙන ජලය ගබඩා කරගෙන ඇතිබව හැගෙයි. මෙම ජලයද තම අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී. මාලිගය ඉදිරිපිට වූ විශාල පොකුණු මගින් මාලිගයේ අලංකාරය තවත් වැඩිවුවා සේම අවටට සිසිලසක්ද ලබා ගැනීමට සමත් විය. ඉන් උෂ්ණ කාලයේදී ඇතිවන උණුසුම් සහගත පරිසරයට මනාවූ සිසිලසක් ලබාදෙයි. මෙම පොකුණු නිර්මාණය කොට තිබුණේ සීගිරියේ එක් පසෙකය.

අනෙක් පෙදෙසෙහි විවිධ ශාක වගා කොට තිබුණි. ඉන් බොහෝමයක්ම බෙහෙත් පැලෑටි හා ඒ සම්බන්ධ ශාකය. රාවණ රජතුමා වෙදකමද මනාකොට ප්‍රගුණ කර තිබුණු බැවින් මෙම ශාක බොහෝමයක් වෙදකම හා බැඳුණු ශාක විය හැක. මෙතුමා තම යානා වලින් පිටරටවල සංචාරය කල ගමන් වලදී සෑම රටකම තිබූ ගස් වැල් හෙළ දීපයට ගෙන ගොස් සීගිරිය අවට වගා කලේය. එබැවින් සීගිරියේ තවත් පැත්තක මනරම් ඔසු උයනක ශ්‍රියාව දක්නට ලැබුණි.

සීගිරිය එක විටෙක බලකොටුවකි. තවත් විටෙක පරීක්ෂණාගාරයකි. තවත් විටෙක උද්‍යානයකි. තවත් විටෙක කලාගාරයකි. කලාගාරයක චිත්‍ර, මූර්ති පමණක් නොව නැටුම් ගැයුම්ද දක්නට ලැබෙයි. එකල හෙළයෝ ඉතා දියුණු රසාස්වාදයකින් යුක්ත පිරිසක් සේම ඉතා ඉහල කලා හැකියාවෙන් කෙල පැමිණියවුන්ය. මොවුන් තම හැඟීම් චිත්‍රගත කර ඇත. ඒවා තම නිවාස වල මෙන්ම රජවරුන්ගේ මාළිගා දක්වාද ගෙනගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සීගිරි බිතුසිතුවම් නිර්මාණය වෙයි.

මුලින්ම රාවණ රජතුමාටත් ප්‍රථමයෙන් සිගිරියේ චිත්‍ර ඇඳ තිබෙයි. ඒවා ඇඳීමට මූලිකත්වය දී ඇත්තේ රාවණ රජතුමාගේ අයියා කෙනෙකු වන කුවේර නැතහොත් වෛශ්‍රවනයි. එම චිත්‍ර තම සිත්තරුන් ලවා එතුමා නිර්මාණය කොට පසු කලෙක රාවණයන්ට පැරදී ඉන්දියාවට පලායන විට සිත්තරනුත් සමඟ උතුරු ඉන්දියාවට ගොස් ඇත. එහිදී ඉන්දියාවේද මාළිගාවක් තනාගත් කුවේරයන් එම මාළිගා වලද චිත්‍ර නිර්මාණය කොට ඇත. ඒ අනුව ඇතැමුන් පවසන්නේ ඉන්දියාවේ අජන්තා චිත්‍ර සම්ප්‍රදායද සීගිරියේ චිත්‍ර සම්ප්‍රදායට බෙහෙවින් එක සමාන බවය.

අතිතයේ මෙය චිත්‍ර කූඨ නමින් හඳුන්වා ඇත. ඊට හේතුව මේ චිත්‍ර විශාල සංඛ්‍යාවක් ඇඳ ඇති කෞතුකාගාරයක් පිහිටා තිබීම විය හැක.

තවත් කුරුටු ගීයක සීගිරි කාශ්‍යප රජතුමා තම රාජධානිය ලෙස සීගිරිය තොරා ගන්නා විට සිගිරි ගලේ ඇන්ද කාන්තාවෝ තෙමෙමින් සිටි බව සඳහන්ව ඇත. ඒ අනුව කාශ්‍යප රජුටත් ප්‍රථම චිත්‍ර තිබී ඇති බැවින් ඒවා බොහෝ දුරට රාවණ රජ සිත්තරුවන් ලවා ඇඳි චිත්‍ර විය හැක. සීගිරි කාශ්‍යප රජුට තිබී ඇත්තේ මේ චිත්‍ර නැවත පාට කොට ස්ත්‍රීන්ගේ උඩුකය වසා නැවත චිත්‍ර පාට කිරීම පමණක් වූ බව ජනප්‍රවාදය කියයි.

සීගිරියේ ඇති සීගිරි චිත්‍රවල සම්ප්‍රදායට සමාන චිත්‍ර ලංකාවේ වෙස්සගිරියෙත්, තිවංක පිළිමගෙයිත්, අම්පාර ගොනාගොල්ල විහාරයේත් දැකගත හැකිය. මේ චිත්‍ර පාට කිරීමට ස්වභාවික පරිසරයෙන් ලබා ගත් වර්ණ යොදාගත් බව දක්නට ලැබෙයි.


ඉහත ආකාරයට විචිත්‍රවත් සීගිරිය බලකොටුව නිර්මාණය කිරීමට රාවණ රජතුමාගේ බිරිඳවූ මන්දෝදරී රැජිනගේ පියා උදව් වී ඇත. මෙතුමා නමින් මයදානවය. අතිශය ශූර නිර්මාණ ශිල්පියෙකි. තවද සීගිරියේ කැටපත් පවුරක් ඇත. ඉන් සීගිරිය හා බැඳුනු යම් දේ පිලිබඳ අදහස් කවියට නැගන ලද පවුරකි. එහි තමාගේ කාව්‍යමය අදහස් ලියා ඇති ස්ථානයක් ද වෙයි. වත්මනේ එනම් සීගිරි කාශ්‍යප රජතුමාගේ කාලයේ කවි හා ගී ලියා ඇත්තේ ඊට ප්‍රථම ගී ලියා ඇති ස්ථානයෙන් මතුපිට බව කියයි. කෙසේ නමුත් කැටපත් පවුරද සීගිරියේ අද්විතීය ස්ථානයක් හිමිවෙයි.

සීගිරිය පිලිබඳ විවිධ ජන කවි ඇත. ඒවා ඉතා රසවත්ය. මේ එම ජනප්‍රවාද හා බැඳුනු ජන කවි වලින් කිහිපයකි.

සීගිරි ගලේ විල සෑදුවේ කවුරුන්දෝ
සීගිරි ගලේ රූ ඇන්දේ කවුරුන්දෝ
සීගිරි රුවෙන් දිස්වෙන්නේ කවුරුන්දෝ
මෙතුන් පදේ විසඳන්නේ කවුරුන්දෝ


සීගිරි ගලේ රාවණ දෙව් විල සෑදුවා
සීගිරි ගලේ විස්කම් සිත්තම් කෙරුවා
සිගිරි රුවෙන් මන්දෝදරි දිස්වෙනවා
මෙතුන් පදේ මට නිසි ලෙස විසදෙනවා

# උමං මාර්ග



අප රටේ හෙළයන් සතුව දියුණු උමං මාර්ග පද්ධතියක් පැවතියේය. හෙළයෝ ගුවන්යානා නිපදවා අහස ජය ගත්තේය. පොළොව අභන්තරයේ මාර්ග සාදා පොළොවද ජය ගත්තේය. පොළොව යට උමං සෑදීමට ඇති හේතු විමසා බලමු. එවිට පෙනී යන්නේ සතුරු කරදර වලින් ආරක්ෂාවීමටත්, ඉතා ඉක්මනින් හෙළදීපය හරහා ගමන් කිරීමටත්, රහස් පණිවිඩ ගෙනයාමටත්, ධනය සගවා තබා ගැනීමටත්, අන්තඃපුර පවත්වාගෙන යාමට මෙම උමං මාර්ග තනා තිබූ බවය. ලංකාවතුල සෑම තැනකටම යා හැකි පරිදි උමං මාර්ග තනා තිබුණි. මෙසේ තනා තිබූ උමං මාර්ග පිළිබඳ කෙටි විග්‍රහයක් කර බලමු.

මුලින්ම ඌව පළාත තුල ඇති උමං මාර්ග පිළිබද සාකච්ඡා කරමු. බදුල්ල දිස්ත්‍රික්කයේ ඌවපරණගම ඇති ස්ත්‍රීපුර කන්දේ උමගක් ඇත. එහි අන්තඃපුරයක් තිබූ බව ජනප්‍රවාද වල කියයි. වළගම්බා රජුගේ මෙන්ම මානාභරණ රජුගේ අන්තඃපුරය ස්ත්‍රීපුර කන්දේ තිබූ බව කියයි. මෙම ස්ත්‍රීපුර කන්දෙන් පටන් ගන්නා උමග මානාඇල්ල නම්වූ සුන්දර දිය ඇල්ල දක්වාම විහිදී යයි. මෙම කන්දේ සිට අන්තඃපුර ස්ත්‍රීන්ට උමග හරහා මානා ඇල්ලට ගොස් දිය කෙළීමේ හැකියාව මේ අනුව ලැබී ඇත. මානා ඇල්ල ද්විත්ව



දියඇල්ලකි. මෙම දිය ඇල්ල නිර්මාණයවීමේ කතාව ඉතා රසවත්ය. දිය ඇල්ල නිර්මාණය ගල මුදුනේ කළුගල කපා ඔපමට්ටම් කර එහි නෑමට අවශ්‍ය නාන ගල් බේසම් සාදා ඇත. එම ගල් බේසම් වලට ජලය ගලින් සෑදූ පීලි පද්ධතියකින් සපයා ඇත. ඒ අනුව එම ගල් බේසම් සමුහයට ජලය පීලි මගින් ලබා දෙයි. එම ජලයෙන් බේසම් පුරවා ඉතිරි ජලය දිය ඇල්ලක ආකාරයට පහලට ගලා යයි. මෙම ආකාරයෙන් මානා ඇල්ල නම් දිය ඇල්ල නිර්මාණය වී ඇත. සීතා දේවියව මෙම ස්ත්‍රීපුර කන්දේ සගවා තිබුබව ජනප්‍රවාදයේ දැක්වෙයි.

බදුල්ල දිස්ත්‍රික්කයේ ඊලග උමං මාර්ගය කරදගොල්ල උමගයි. මෙම උමග මාර්ගය ඇතුලත 60 දෙනෙකුට පමණ පහසුවෙන් රැඳී සිටියහැක. ඉදල්ගස්හින්න දුම්රිය ස්ථානයට පහලින්ද උමගක් තිබුබව 1997 සොයා ගන්න ලදී. ඊලග උමං මාර්ගය ඇත්තේ හාලිඇල බෝගොඩ රජමහ විහාරය අසලය. මෙම විහාරස්ථානයේ ඇති උමග හරහා නාරංගල කන්දට, මහනුවරට හා බදුල්ල කතරගම දේවාලයට යා හැකි බව ජනප්‍රවාදයේ කියයි. ඊලගට රාවණ ගුහාවේ ඇති උමග පිළිබදව විමසා බැලීමේදී එය ඇල්ල ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. මෙම ගුහාවේ රාවණ රජතුමා රාම රාවණ යුධ සමයේ සැගවී සිටි බව ජනප්‍රවාදයේ

කියයි. සොරණතොට බුදුමුත්තාගල යයි හඳුන්වනු ලබන තැන්හී විශාල ගල් ගෙයක් ඇත. එම ගල් ගෙය හා සම්බන්ධ උමගක් බෝගෙඩට මතුවිය හැකිබව කියයි.


ඌව පළාත හැරුණුකොට නුවරඑළියේ ඇති උමං සලකා බැලීමේදී නුවරඑළිය තලගලකන්දේ සිට නුවරඑළිය කිකිළියාමාන කන්ද දක්වාත් එහි සිට වැලිමඩ ඌවපරණගම ස්ත්‍රීපුරකන්ද දක්වාත් උමං මාර්ග තිබු බව කියයි. වර්ථමානයේ හක්ගල උද්‍යානය රාවණ රජතුමාගේ ඖෂධ උයනබව කියයි. ඒ අනුව ස්ත්‍රීපුරකන්දේ සිට නුවරඑළියේ හක්ගලටද උමං මාර්ගයක් තිබී ඇත. ස්ත්‍රීපුරකන්දේ උමගේ සැගවී සිටි සීතා දේවියට කුෂ්ඨ රෝගයක් වැලදී ඇත. මීට හේතුව වී ඇත්තේ සූර්යයා ලෝකය ඇයට නොලැබීමයි. ඒ අනුව සූර්යයා ලෝකය ලබා ගැනීමට සීතා දේවිය ස්ත්‍රීපුරකන්දේ සිට නුවරඑළියේ හග්ගලට මෙම උමං මාර්ගය ඔස්සේ පැමිණ ඇත.

ඌවපරණගම ස්ත්‍රීපුරකන්දේ සිට ඇති උමං මාර්ගයක් මහියංගනය දක්වාද ඇත. මහියංගනයේ සිට එම උමං මග ලග්ගල දක්වා ගමන් කරයි. එම මග විශාලය. කෙසේද යත් එම උමග තුල මිනිසුන් හත් දෙනෙකුට එක පෙළට යා හැකි තරම් විශාලය. සීගිරියද උමං මාර්ග පද්ධතියක කේන්ද්‍රස්ථානයකි. එය මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. ඇඹිල්ල විහාරයේ කන්දේ සිට සීගිරිය දක්වා උමං මාර්ගයක් ඇත. සමනල කන්ද අවටද උමං මාර්ග පද්ධතියක් ඇත. මෙම උමං මාර්ග නිර්මාණය කර ඇත්තේ මිනිස් ඇසට නොගැටෙන ලෙසටය. ඒවායේ උමං විවර බොහෝවිට හඳුනාගත නොහැකි ආකාරයට සාදයි.

උමං සෑදීමට විශේෂ තාක්ෂණයක් යොදාගෙන ඇත. හෙළයන් සතුව කළුගල් පාන්මෙන් දියකිරීමේ ඖෂධ බෙහෙත් ඇත. එම ඖෂධය භාවිතා කරමින් විශාල පර්වත දිය කරමින් දර්ශනීය උමං

මාර්ග යක්ෂ ගෝත්‍රකයන් තනා ඇත. මෙම උමං බොහෝමයක් නාග ගෝත්‍රිකයන් නඩත්තු කර ඇති අතර සමහරක් යක්ෂ ගෝත්‍රකයන් නඩත්තු කර තිබෙයි.

# ග්‍රහ තාරකා පිළිබඳ ඥාණය



රාවණ රජතුමා ග්‍රහ තාරකා පිළිබදව නිරන්තරයෙන් තම අවධානය යොමුකල පුද්ගලයෙකි. මේ සදහා තම රජමාළිගාව ලෙස භාවිතා කල සීගිරි පර්වතයම යොදාගෙන ඇත. ඊට හේතුවක් ලෙස සිතිය හැක්කේ සීගිරි පර්වත මුදුනේ පිහිටිමත්, අවට ඊට උස් ගිරිශිකර නොපැවැත්වීමත්ය. මෙම භෞතික පිහිටීමේ වාසිය එතුමා ග්‍රහ තාරකා නිරීක්ෂණයට උදව් කොටගෙන ඇත.

සීගිරි ගල මුදුන තුන් මහලකින් යුක්තය. එහි ඉහලම මහල මෙතුමා තම ග්‍රහ තාරකා නිරීක්ෂණයට යොදාගෙන ඇත. මෙම කටයුතු වලට පුලස්ථි ඍෂිතුමාගේ සහාය නොඅඩුව ලැබී ඇත. ග්‍රහලෝක අතර සම්බන්ධය සම්බන්ධයෙන් මොවුන් දෙදෙනාට හසල දැණුමක් තිබුනි. එහිදී විවිධ ග්‍රහලෝක සමග දීර්ඝකාලීන අන්තර්

සම්බන්ධතා පවත්වා ඇත. මෙම සබදතා පදනම් කොටගෙන මෙතුමා යටත් කරගත් ග්‍රහලෝක වල තොරතුරු තවද විවිධ ග්‍රහලෝක අතර දැණුම හුවමාරු කර ගැනීමට මග පෑදී ඇතුවාක් මෙන්ම ග්‍රහලෝක අතර තිබෙන යුද්ධ වලට අදාල තොරතුරුද සන්නිවේදනය කොටගෙන තිබේ.මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙතුමා රාම රාවණ යුද්ධයේදී භාවිතා කල **අග්නි සැර** නම් ආයුධයද පිටසක්වලින් ලැබී ඇති බව සිතිය හැක.

තවද පිරමීඩ තැනීමේ තාක්ෂණයද පිටසක්වලින් ලැබු බව හෙළයෝ විශ්වාස කරයි. ඔවුන් එසේ පවසන්නේ මෙම ග්‍රහතාරකා අතර සම්බන්ධය නිසාම එම තාක්ෂණය ලැබු නිසාවෙනි. රාවණ රජතුමාගේ මූලිකත්වයෙන් හා පුලස්ථි ඍෂිතුමාගේ සහභාගීත්වයෙන් ඉර, හද, තරු, ග්‍රහලෝක පිළිබදව පුළුල් විද්වත් සමුළු පවත්වා ඇත. ඇතැම් විට මීට පිටසක්වල ජීවීන්ද සහභාගී වන්නටද ඇත. මෙම සහභාගීත්වය ඇතැම්විට ඔවුන්ගේ භෞතික හැඩයෙන් හෝ චිත්ත බලයන් හෝ විය හැක.

## ගුවන් යානා තාක්ෂණය

ගුවන් යානයක් ගමන් කරන්නේ අහස් ගැබෙහිය. මේ හේතුවෙන් රටක අභ්‍යන්තරයේ හෝ ඉන් පිටතට රටවල් අතර ගමනා ගමනය ඉතා කෙටි කාලයකින් හා පහසුවෙන් සිදු කිරීමට ගුවන් යානයකට හැකිය.

ගුවන් යානා ගැන කතා කරන විට ඇමරිකන් ජාතික රයිට් සහෝදරයන් නිතැතින්ම මතකයට එයි. මුලින්ම ගුවන්යානා නිපදවීමේ ගෞරවය ලෝකවාසීහු මෙම දෙදෙනාට ලබාදෙති. නමුත් ඔවුනට ප්‍රථම රාවණ රජතුමා දඬුමොණරය නිපදවූ බවට සාක්ෂි විවිධ ලේඛනවල දක්නට ලැබෙයි. එසේ හෙයින් මෙතුමාගේ ගුවන් තාක්ෂණ ඥාණය ගැනද මදක් විමසා බලමු.

ඓතිහාසික තොරතුරු අනුව රාවණ රජතුමාගේ යුගයේදී මෙම යානා නිපදවා ඇත්තේ ලී වලිනි. එම ලී තිබී ඇති බව කියනුයේ හිමාල කන්දේය. එහි මයුරදණ්ඩ නම් රුක්ෂයන් වෙයි. එම රුක්ෂයේ ලී ගෙන (මයුරදණ්ඩ ලී) ගුවන් යානා නිපදවූ බව කියයි. මෙම ලී විශේෂයම තෝරා ගැනීමට හේතුව වන්නේ එය ඉතා ශක්තිමත් ලීයක් බැවිනි. තවද මෙම ලීයේ කැඩෙන බිඳෙන සුළු ස්වභාවයක් නොමැත. එසේ වුවද ලීය ඉතා සැහැල්ලුය. මෙම ශාකයේ කොළ හා අතු මොණර පිල්හැඩයක් ගනී. මොණරුන් බොහෝ විට මෙම ගස් ආශ්‍රිතව විසීමට ප්‍රියතාවයක් දක්වයි. මෙම සතුන් බොහෝ විට මෙම ගසේ වෙසෙන බැවින් මෙම ගසට මයුරදණ්ඩ ගස ලෙෂ නමක් පටබැඳිනි.

මෙම යුගයේ හෙළයන්ට ගුවන් යානා වර්ග රැසක් තිබී ඇත. විමන් නමින් විශාල ගුවන්යානා, අහස්යානා, කන්දක සිට තවත් කන්දකට ගමන් කල හැකි යානා මින් ප්‍රමුඛත්වක් ගනී. මීට

අමතරව රාවණ රජතුමාට පුෂ්පක විමානය හා දඬුමොණරය ලෙසද යානා දෙකක් තිබී ඇත.

පුෂ්පක විමානය විකුම් නම් ඇඳුරුතුමා නිර්මාණය කොට ඇත. විකුම් ඇඳුරුතුමා ගැන සලකා බලන විට හෙතෙම පුලස්ථි ඍෂිතුමාගෙන් ශිල්ප උගත්තෙකි. පුෂ්පක විමානය යනු කුඩා ගුවන් යානයකි. මෙය රන් රුවනින් නිපදවා ඇත. එබැවින් අතිශයින්ම අලංකාරය. ඉතා වේගයෙන් ගමන් කල හැක. අහසේදී මෙම යානය පිපුණු මලක හැඩයක් ගත් නිසා ඊට පුෂ්පක කියානම් තබා ඇත. මෙම යානය රට අභ්‍යන්තරයේ ගුවන් ගමන් සඳහා යෙදාගෙන ඇත.

නමුත් දඬුමොණරය ඉතා විශාල ගුවන්යානයක් බව කියයි. එම යානාව සුලං බලයෙන් ක්‍රියාකර ඇත. ඉන්ද්‍රජිත් ලෙස හඳුන්වන්නේ රාවණ රජතුමාගේ පුත්‍රයාය. මෙතුමා යුද්ධයට අති දක්ෂයෙකි. එඩිතර රණකාමියෙකි. මෙතුමාගේ මෙම හැකියාව නිසාම සහශ්‍රගත ගුවන් යානය මෙතුමාට හිමිවී ඇත. මෙම යානයේ විශේෂත්වය වන්නේ අහසේ සිටම සතුරු සේනාව සමඟ හෝරවක් වැනි කාලයක් වුවද අහසේ නවතා සටන් කල හැකිවීමයි.

# සූනියම් ශාන්ති කර්මය

රාවණ යුගයේ රාවණයන්ට විභීෂණ නමින් සහෝදරයෙක් විය. ඔහු මාලනී නම් නාග ගෝත්‍රික රැජිණගේ දරුවෙකි. රාවණ රජතුමාගේ පියාට බිසෝවරු කිහිප දෙනෙකු සිට ඇති අතර ඉන් එක් බිසවක් වුයේ මාලනී රැජිණයි. විභිෂණ කුමරුට සහෝදරියක් සිටිබව කියයි. මේ සහෝදරිය තමාගේ හොඳම මිතුරා වන වසවතුට විවාහ කරදීමටත් වසවතුගේ නැගණිය තමා විවාහකර ගැනීමටත් පොරොන්දුවී සිටියේය.

පසු කාලකදී පොරොන්දු කඩකොට විභීෂණ කුමරුගේ නැගණිය මැණික්පාල මහාසම්මත රජු සමඟ විවාහ විය. මෙයින් අමනාප වු වසවතු පළිගැනීමට සිතා නොයෙක් සතුරුකම් කලේය. ඒ අනුව එම සතුරුකම් වලින් ආරක්ෂාවීමටත්, ශාන්තිය ලබා ගැනීමටත් සිතා සූනියම් ශාන්ති කර්මය විභිෂණ කුමරුගේ නැගණිය හා මැණික්පාල මහාසම්මත රජු කළ බව ඉතිහාසයේ දැක්වෙයි.

# දහඅට සන්නිය

හෙළයන්ට අති විශිෂ්ඨ නැටුම් කළාවක් තිබුණි. රාවණ රජතුමා විශිෂ්ඨ කළාකරුවෙකි. තමන්ගේ හමුදාවට දුටුවන් බියකරන වෙස් මුහුණු වලින් සැරසී සටන් කල හැකි සේනාංකයක් පවත්වාගෙන ගියේය. මෙය ලෝකයේ හමුදාවකට සංස්කෘතික අංගයක් එක්කල අවස්ථාවක් වෙයි.

මුහුණු 18 කින් යුත් යක්ෂ නැටුමක් එකල යක්ෂ ගෝත්‍රිකයන්ට තිබුණි. මෙය පසු කලෙක 18 සන්නිය වශයෙන් රුහුණු නැටුමට එක්විය. පසුව මෙම යක් නැටුමට නාග ගෝත්‍රිකයන්ගේ නැටුම්, ගැයුම්, වැයුම් එක්වී විචිත්‍රවත් නැටුම් අංගයක් ඉදිරිපත් විය. මීටම නයි පෙන සහිත වෙස් මුහුණක් එක්විණි. ඉන් පෙන්වන්නේ නාග ගෝත්‍රික සටන්කරුවන්ය.

මෙම නැටුමට භාවිතා කරන යක් බෙරය රාවණ යුගයේ සිටම පැවත එන්නකි. එය වෙනස්වී නොමැත. වර්ථමානයේදී මහසෝන් යකා, ගරා යකා, රීරි යකා යනුවෙන් රඟපාන යකුන් රැසක් ඇත. මෙම බෙරය වර්ථමානයේ තොවිල් කටයුතු සඳහා භාවිතා කරයි.

# <u>ගෘහ නිර්මාණ ශිල්පය</u>

නිල්ගල වළව්වේ පොත් ගුලෙහි විශේෂ පුස්කොළ ග්‍රන්ථ දෙකක් ඇත.

1. රාවණ කතා
2. ගෘහ නිර්මාණ ශිල්පය

මේ අනුව එකල ගෘහ නිර්මාණ ශිල්පය ගැන මදක් විමසා බලමු. හෙළ යුගයේ මහල් දෙකේ, මහල් තුනේ මෙන්ම මහල් සතක් ඇති ප්‍රාසාදයන්ද තිබී ඇත. මේවා රාත්‍රි කාලයේදී විදුලි බුබුලු වැනි දෙයකින් ඒකාලෝක කර තිබු බව කියයි. රන්, රිදී, මුතු, මැණික් ආදී වටිනා පාෂාණ මෙම මන්දිර වලට ඔබ්බවා අලංකාර එළි මතුකොට ගෙන තිබේ. මෙසේ මෙම ප්‍රාසාද නිර්මාණය කර ඇත්තේ සූර්යා නැගෙන විට ඉන් නිකුත් වන ආලෝකයෙන් එම මැඳුරු වල ඇති වටිනා රත්නයන්ට සතර අතම බබලන්ටය. තවද සූර්ය ශක්තිය ගබඩා කොට ගෙන රාත්‍රියේදී ආලෝකය ලබා ගැනීමට යොදාගෙන තිබේ.

මෙම මහල් බොහෝමයක් ශක්තිමත් දැව වලින් නිර්මාණය කර අති බව ජනවහරයේ කියවෙයි. ඉහල ප්‍රභූ පන්තිය තම නිවාස සිලින්ඩරාකාර මහත කුළුණු වලින් සාදා ගැනීමට මහත් රුචිකත්වයක් දක්වා ඇත. බොහෝ මන්දිර දැව වලින් නිර්මිතය. මෙම මන්දිර විවිධ වර්ණ වලින් වර්ණගන්වා අලංකාර කර ඇති බව කියයි.

ඇතැම් මන්දිර පොළොව යට තනා ඇත. ඒවා විශාල ගල් කුළුණු වලින් සාදා ඇත. මකර නම් සෙන්පතියාගේ මාලිගා සංකීර්ණයද පොළොව යට සාදා ඇති බව කියයි. ඈත යුගයේ දැව හා කළු

ගල් වලට අමතරව හුණු, ගල්, වැලි, කළුගල් කුඩුද ගෙන ඇත. ඊට අමතරව ඉපැරණි බදාම වර්ග භාවිතා කොට ඇත.

මය දානව ලෝකයේ සිටි විශිෂ්ඨතම ගෘහ නිර්මාණ ශිල්පියාය. මෙතුමාගේ දියණිය මන්දෝදරියයි. මයදානවයන් අතින් නිර්මාණය වු විශිෂ්ඨතම නිර්මාණය සීගිරියයි. මෙවැනිම මාලිගයක් ලකේගල කඳු මුදුනේ තිබු බව ජන ප්‍රවාදයේ එයි.

# <u>කාල තරණය</u>

කාල තරණය බොහෝ විට කාලය හරහා අතීතයට හෝ අනාගතයට යාම සිදුවෙයි. මෙය බොහෝවිට මානසික ශක්තියකින් හෝ කාලතරණ යන්ත්‍රයකින් සිදුකල හැක.

මේ සඳහා එතුමාගේ කාලයේ ඉතා දියුණු මානසික ශක්තියක් ඇත්තවුන් සිටි බැවින් ඔවුන් කාලය හරහා ගමන් කරන්නට ඇති බව සිතෙයි. ඉසුරුමුණියේ රන්මසු උයනේ ගලක පිහිටි කාලහෝරා යන්ත්‍රයෙන් මෙවුන් කාලතරණය කල බව සිතෙයි. මෙම ස්ථානයේ පස් දෙනෙකුට ඉද ගැනීමට ආසනද පනවා ඇත. ඇතැම්විට මෙම ආසන වල රාවණ රජතුමා මූලිකත්වය ගෙන පුලස්ථි ඍෂිතුමා, විශ්වමුණි, මේඝනාද හා කාලනියම් අසුන්ගත් ආසන වන්නට ඇත. එතැන සිට ඔවුන් සාකච්ඡා කොට විශ්වය හරහා කාලතරණ සම්බන්ධකම් මනාව වර්ධනය කරගන්නට ඉඩ ඇති බව සිතෙයි.

මීට අමතරව පිටසක්වල සමග සබදකම් පෑ තරු දොරටුවක්ද ඇත. මෙම දොරටුවෙන් ප්‍රයෝජනය ගැනීමට ක්‍රම දෙකක් ඇත. ඉන් එක් ක්‍රමයක් වන්නේ තරු දොරටුව ඉදිරිපිට වාඩිවී භාවනා කර විඥාණය හරහා පිටසක්වල හෝ විශ්වය සමග සම්බන්ධවීමයි.

දෙවන ක්‍රමය වන්නේ භෞතික ශරීරයෙන් මනෝමය ශරීරයක් මවා විශ්වය හරහා ගමන් කිරීමයි. හෙළයේ තරු දොරටු වැඩි සංඛ්‍යාවක් පිහිටීමෙන් කියවෙන්නේ විශ්වය හා නිරන්තර සම්බන්ධකම් පැවැත්වූ බවයි.


# අංගම් සටන් කලාව

රාවණ රජතුමාගේ කාලයේ ඉතාම දියුණු සටන් කලාවක් හෙළයාට තිබිණි. එය අංගම් ශාස්ත්‍රය ලෙස හඳුන්වයි. මෙය ආත්මාරක්ෂක සටන් ක්‍රමයකි. මෙම සටන් කලාව කරාතේ, කුංෆු වලට වඩා පැරණිය. මෙය අපේ දේශිය සටන් ක්‍රමයකි. මෙම ශාස්ත්‍රයේ ආරම්භකයා වනනේ රාවණ රජතුමාය.

අංගම් ශාස්ත්‍රයේදී තමා වෙත එන ප්‍රහාරකයාට අත්පා වලින් පහරදී දූර්වල කිරීම සිදුකරයි. මෙහිදී වැදගත් වන්නේ ප්‍රදිවාදියාගේ නිල ස්ථාන බලා පහරදී ඔහුව අඩපන කිරීමක් සිදුකිරීමයි.

මුශඨි ප්‍රහාරී තන්ත්‍ර නම් අංගම් ශාස්ත්‍රයේ මුලික කරුණු දැක්වෙන ග්‍රන්ථයක් රාවණ රජතුමා රචනා කොට ඇත. මේ ග්‍රන්ථයට අනුව අංගම්පොර සටන් ශිල්පියා හුදෙක් ආයුධ රහිත අයෙකි. මේ අනුව සටන් කරන්නාට මිනිස් සිරුරේ නිලස්ථාන පිළිබඳ අවබෝදයක් ලබාදීම මෙම කෘතියෙන් සිදුකරයි. තවදඑම පොතේ නිලස්ථාන 7 ක් පිළිබඳ සඳහන් කොට ඇත.

# රාවණා හත්ථ



රාවණ රජතුමා කලාකාමී හදවතක් ඇත්තෙකි. එතුමාට සංගීතය පිළිබදව ඉහල දැනුමක් තිබී ඇත. ඒ අනුව එතුමාම සංගීත භාණ්ඩයක් නිර්මාණය කොට ඇත. එය රාවණ හත්ථ වශයෙන් හඳුන්වයි.

## <u>මූලාශ්‍ර</u>

හෙළ ඉසිවර මහ රාවණ : පූජ්‍ය බෝපිටියේ ආරියඥානහිමි

රාවණ ශිෂ්ටාචාරය : ආචාර්ය මිරැන්ඩෝ ඔබේසේකර

රාවණ අමරණීයයි : ආචාර්ය මිරැන්ඩෝ ඔබේසේකර

ශ්‍රී ලංකාවේ රාවණ අධිරාජ්‍යාගේ සංස්කෘතික උරුමය : ආචාර්ය මිරැන්ඩෝ ඔබේසේකර

රාවණා යළි නැගිටියි : ආචාර්ය මිරැන්ඩෝ ඔබේසේකර

ශ්‍රී ලංකා රාවණ රාජධානිය : ආරියදාස සෙනෙවිරත්න

ලංකේෂ්වර මහා රාවණ : සමන්ලීමා විජේසුන්දර පෙරේරා

සහස්‍රමුඛ රාවණ : ගයාන් සඳකැළුම් විතාන ගමගේ

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔපනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධයාපන අමාත්‍යාංශයට පුද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුලින් ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාත්‍යන්තර තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් හා පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ**

2023.10.23